# GMOA

ESTABLISHED IN
1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


27-09-2012

**මාධ්‍ය නිවේදනය**

**පශ්චාත් උපාධි අවස්ථා ඇති නොවීමෙන් පැන නැඟි ඇති අර්බුදය**

දිවයිනේ සියළුම පශ්චාත් වෛද්‍ය අධ්‍යාපන පාඨමාලා මෙහෙයවන හා විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළු බොහෝ පශ්චාත් වෛද්‍ය උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලබන්නේ කොළඹ වෛද්‍ය පීඨයට අනුබද්ධ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය මඟිනි.

පසුගිය වසර 3 ඇතුළත (2011 වසර) කාලය තුළ අලුතින් පශ්චාත් උපාධි පාඨමාලා විශාල සංඛ්‍යාවක් ආරම්භ කල අතර, ශ්‍රේණිධාරී වෛද්‍යවරුන්ගේ වෘත්තිය සුදුසුකම් ඉහළ දැමීමට හා වඩාත් ගුණාත්මක වෛද්‍ය සේවාවක් ජනතාවට ලබාදීමේ අභිලාෂය දැමිනි. එහෙත් 2012 වසරේ මෙම අලුතින් ආරම්භ කල පාඨමාලා බොහෝමයක් අතර මඟ නතර කිරීම හා ඇරඹීමට නියමිතව තිබූ පාඨමාලා දිනෙන් දින ප්‍රමාද වන තත්ත්වයක් උද්ගතව ඇත. සමහර පාඨමාලා සෞඛ්‍ය අමාත්‍යංශය මඟින් වහා ආරම්භ කරන ලෙස දැනුම් දී තිබියදීත් මෙසේ පශ්චාත් උපාධි ආයතනය මඟින් ප්‍රමාද කරමින් පවතියි.

ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව විශේෂඥ පුහුණුව, තොරතුරු තාක්ෂණික ජීව විද්‍යා පාඨමාලාව , මානසික වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව, දැඩි සත්කාර පිළිබඳ විශේෂඥ පාඨමාලාව, හදිසිප්‍රතිකාර පිළිබඳ විශේෂඥ පුහුණුව මෙසේ කල් දමමින් හා අතරමග නතරකරමින් ඇති පාඨමාලා වේ. මීට අමතරව වෛද්‍ය පරිපාලනය පිළිබඳ එම්.එස්.සී. පාඨමාලාවට බඳවාගත් වෛද්‍යවරුන්ගේ පුහුණුව ආරම්භ නොකර මේ වන විට වසරක පමණ කාලයක් ගතව ඇත. එසේම පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ එක් එක් විෂය ක්ෂේත්‍ර වලට අදාල විද්වත් වෛද්‍ය මණ්ඩල වල විශේෂඥ වෛද්‍යවරුන් බොහෝමයක් දෙනා වර්තමාන තත්ත්වය කෙරෙහි අප්‍රසාදය දක්වයි.

දිවයිනේ සමස්ථ වෛද්‍යවරුන්ගේ වෘත්තිය ගැටළු හා පොදු ජනතාවගේ සෞඛ්‍ය අභිවෘද්ධිය කෙරෙහි නිරන්තර අවධානයෙන් පසුවන රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වර්තමාන පශ්චාත් උපාධි ආයතනයේ අකාර්යක්ෂම වැඩපිවෙල කෙරෙහි දැඩි අවධානය යොමු කර ඇත. මේ සම්බන්ධව කිහිපවරක් කරුණු දැක්වූ අතර , සාකච්ඡා ද පවත්වා ඇත. නමුත් ඒ කිසිවක් නොතකා තම අභිමතය පරදි ක්‍රියාකරන වර්තමාන පශ්චාත් උපාධි ආයතනයේ පාලනය හා හානිකාරී වැඩපිළිවෙල ශ්‍රේණිධාරී වෛද්‍යවරු ඇතුළු බහුතර වෛද්‍යවරුන්ට දැඩි අසාධාරණයක් හා එමඟින් සමස්ත සෞඛ්‍ය සේවයටම දැඩි බලපෑමක් වනු ඇත. එබැවින් රජයේ වෛද්‍ය නලධාරීන්ගේ සංගමය බලධාරීන්ට මේ පිළිබඳ කඩිනම් පියවරක් ගැනීමට බල කර සිටී.

ශ්‍රී ලංකාවේ පශ්චාත් වෛද්‍ය අධ්‍යපනයේ හදවත බඳු මෙම ආයතනය වඩාත් සුදුසු හා කාර්යක්ෂම පාලනයක් යටතේ නගා සිටුවීමට කාලය එළඹ ඇති බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය දැඩි ලෙස අවධාරණය කර සිටියි.

ස්තුතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

වෛද්‍ය එස් එච් කොලඹගේ 0718429442
වෛද්‍ය නාත් විජේසූරිය 0714928322
වෛද්‍ය නවීන් ද සොයිසා 0718582444